# ඩෙරිඩියානු විසංයෝජනය හා බෞද්ධ අනිත්‍ය සංකල්පය: නීට්ෂේගේ බෞද්ධ සබඳතා ඇසුරින් කළ විමසීමක්

මහින්ද පතිරණ


**සාරාංශය**

ජැක් ඩෙරීඩාට (1930-2004) අනුව විසංයෝජනය පිළිබඳ සංකල්පය ඔහු විසින් සපයා ගනුයේ ජර්මන් ජාතික මාර්ටින් හයිඩෙගර්ගෙනි. හයිඩෙගර්* විසින් එය නීට්ෂේගෙන් ද නීට්ෂේ එය බුදුදහමින් ද සපයා ගත් බව මෙම ලිපියේ දී යෝජනා කෙරේ. වර්තමාන ලිපියෙහි ශාස්ත්‍රීය ක්‍රමවේදය වංශාවලි කථනය මගින් කිසියම් සංකල්පයක නියම ස්වරූපය හඳුනා ගැනීම ය. එය හයිඩගෙරියානු හා නීට්ෂියානු ක්‍රමවේදයකි. ඒ අනුව මෙම ලිපියෙහි අරමුණ විසංයෝජන සංකල්පයේ වංශාවලි කථනයක් කොට බෞද්ධ අනිත්‍යතාව හා තුලනාත්මක අධ්‍යයනයකින් එකී සංකල්පයට හිමි තැන වත්මන් දැනුම් පද්ධතිය මත සිතියම් ගත කිරීම යි. මෙහි ඩෙරිඩියානු විසංයෝජනය සඳහා මූලාශ්‍රයමය වශයෙන් බොහෝ සෙයින් පදනම් වන්නේ ඩෙරීඩා** විසින් විසංයෝජනය විස්තර කරමින් 1983 ජුලි මස 30 වන දා ජපන් ජාතික මහාචාර්ය ඉසුසු වෙත යවන ලද Letter to a Japanese(1883) නම් ලිපිය යි.


---

*එඩ්මන් හුසල්ගේ මුල්කාලීන මිත්‍රයෙකු වූ හයිඩෙගර් ජර්මනිය හිට්ලර්ට නතුවීමත් සමග ම දේශපාලනයට පිවිසෙයි. හිට්ලර්ගේ බලය මගින් ප්‍රයිබුග් විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරයට පත්වන හෙතෙම 1933 මැයි මස 3 දා නාසි පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත්තේ ය. පිලිප්සේට අනුව මුළු ප්‍රයිබුග් විශ්වවිද්‍යාලය ම නාසි ධර්මයට පෙරළීමට හයිඩෙගර් දැඩිලෙස වෙහෙස වූවේ ය. ( Philipse,H 1999: 244)

** 1930 ඇල්ජීරියාවේ ඇල්පියස්හි දී යුදෙව් ජාතික දෙමාපියනට දාව ඩෙරීඩා උපත ලබන්නේ ය. හෙතෙම වයස 19 දී ඇල්පියස් සිට ප්‍රංශයට සංක්‍රමනය වන්නේ ය. මේ අතර දෙවරක් ම ප්‍රතික්ෂේප වී තෙවනවර දී ඩෙරීඩා සාත්‍රේ ආදීන් තම වෘත්තීන් ඇරඹූ ප්‍රසිද්ධ Ecole Normale superieure නම් උසස් අධ්‍යාපන

ආයතනයෙහි ඉහනිමට අවස්ථාවක් උදාවන්නේ ය. ඩෙරිඩාගේ දාර්ශනික චින්තාවන් මුල් අවදියේ සිට ම බොහෝ විට සකස් වන්නේ ෆ්‍රෙඩ්රික් නීට්ෂේ, මාර්ටින් හයිඩෙගර්, ෆර්ඩිනෑන්ඩ් සොසියු, එඩ්මන්ඩ් හුසල් ආදි චින්තකයින් හරහා ය.

## හැඳින්වීම

## විසංයෝජනය : පොදු නිර්වචනය

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂය විසංයෝජනය නිර්වචනය කරනුයේ විචාර පූර්වක විශ්ලේෂණ උපක්‍රමයක් ලෙස යි (Oxford English Dictionary: ed, James, A.H et el 1989). කැනඩාවේ ටොරොන්ටෝ විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයක් වන නූතන සාහිත්‍ය න්‍යාය පිළිබඳ වූ විශ්වකෝෂය, විසංයෝජනය 1960 දශකයේ අග භාගයේ ප්‍රංශයේ ඇති වූ දාර්ශනික ගුරුකුලයක් ලෙස දක්වයි. (Encyclopedia of Contemporary Literary Theory, ed Irena, R: 1993). මේ අතර ලන්ඩන්හි බ්ලැක්වෙල් ප්‍රකාශනයක් වන සාහිත්‍ය වාංමාලා හා සාහිත්‍ය න්‍යාය පිළිබඳ ශබ්දකෝෂය (1991) ද විසංයෝජනය නිර්වචනය කරයි. ඊට අනුව විසංයෝජනය යන පදයෙන් ගම්‍ය වන්නේ පාඨනය පිළිබඳ සුවිශේෂී භාවිතයක් වන හෙයින් එය විචාර ක්‍රමවේදයක් හා විශ්ලේෂණාත්මක විමර්ශන විධියකි. (Dictionary of Literary Terms and Literary Theory: Ed, Preston, C, E: 1991). විචාර න්‍යාය පිළිබඳ ශබ්දකෝෂය විසංයෝජනය නිර්වචනය කරනුයේ කෘතියේ ප්‍රතිවිරුද්ධ තර්කනය හීන කිරීමට ප්‍රයත්න දරන කියවීම් න්‍යායක් ලෙස ය (A Dictionary of Critical Theory: ed Orr,L 1996 ). දර්ශනය පිළිබඳ වූ අන්තර්ජාල විශ්වකෝෂය ද ස්වකීය නිර්වචනය පහත එන ලෙස සපයයි. විසංයෝජනය යනු, කිසියම් කෘතියක් තිරසාර විශ්ලේෂණයකට ලක් කිරීමකි. ඊට අනුව විසංයෝජනය යනු අනිවාර්යෙන් ම පරස්පර වූ විධානයන්ට සමීප අවධානය යොමු කරන ක්‍රමවේදයකි. (Deconstruction, by Renolds, Jack, *The Internet Encyclopedia of Philosophy*, http:// www.iep.utm.edu/, today's date).

ඉහත දක්වන ලද සෑම නිර්වචනයකට ම අනුව විසංයෝජනය යන්න කිසියම් මෙවලමක ක්‍රමවේදයක හෝ විධික්‍රමයක හැඩතල ගන්නා බව පෙනේ. එනම් මෙකී මෙවලම හෝ උපකරණය භාවිත කරමින් කෙනෙකු විසංයෝජනය කිරීමේ හැකියාව ලබා ගත හැකි ය. ඒ අනුව විසංයෝජකයෙක් ද බිහි වන්නේ ය.

මේ අතර විසංයෝජනය පිළිබඳ ඩෙරිඩා විසින් ම ගෙනහැර පාන නිර්වචන හෝ නිරුක්ති අධ්‍යයනය කිරීම මගින් ඉහත එන නිර්වචනයන්හි ප්‍රාමාණිකත්වය හෝ බෙලහීනතාව මොනවට අවබෝධකට හැකි ය.

## විසංයෝජනය (නො)යනු කුමක් ද?

විසංයෝජනය යන්න නිර්වචනය කිරීමේ දී ප්‍රථමයෙන් ම ඩෙරිඩා විසින් කරනුයේ විසංයෝජනය වන්නේ කුමක් ද වශයෙන් නොව විසංයෝජනය නොවන්නේ කුමක් ද යන්න විමසීම ය. පහත එන පාඨ අප උපුටා ගනුයේ ඩෙරිඩාගෙනි : විසංයෝජනය යනු විශ්ලේෂණයක් ද විචාරයක් ද නොවේ. විශේෂයෙන් ම එය විශ්ලේෂණයක් නොවන්නේ කිසියම් ව්‍යුහයක් කඩා බිඳ දැමීම තවත් කිසියම් සරල ධාතුවක් වෙතට හෝ කඩා බිඳ දැමිය නොහැකි මූල ධාතු හෝ වෙතට ගමන් නොකරන බැවිනි. මෙම වටිනාකම් ද අදාළ විශ්ලේෂණය සේම විසංයෝජනයට ලක්වන දාර්ශනික සංස්කාරයන් ය. මේ අතර විසංයෝජනය යනු සාමාන්‍ය අර්ථයෙන් හෝ කාන්ටියානු අර්ථයෙන් කෙරෙන විචාරයක් ද නොවේ (Derrida, J: 1883: 3). යථෝක්ත කරුණු අනුව ඩෙරිඩාගේ විසංයෝජනය ඔවුන්ගේ ම ප්‍රකාශකට අනුව විශ්ලේෂණයක් හෝ විචාරයක් නොවේ. ඩෙරිඩා මින් නවතින්නේ නැත. ඔහු තව දුරටත් විසංයෝජනය නොවන්නේ කුමක් දැයි විස්තර කරයි. මම ඉහත කරුණ ම ක්‍රමය පිළිබඳ ව ද පවසමි. විසංයෝජනය යනු ක්‍රමවේදයක් හෝ ක්‍රමයක් නොවේ. එය එවැන්නකට හැරවිය ද නොහැකි ය. විසංයෝජනය කිසියම් ක්‍රමවේදාත්මක උපකරණයකට හෝ නීති පද්ධතියකට හෝ පරිපාටියකට ඌනනය කළ නොහැකි ය. පැහැදිලි ව ම කිව යුත්තේ විසංයෝජනය යනු ක්‍රියාවක් හෝ

මෙහෙයුමක් ද නොවන බව ය. (Derrida, J: 1883:3). ඩෙරීඩා විසින් කරන ලද ඉහත පැහැදිලි කිරීම මගින් ප්‍රසිද්ධ ශබ්දකෝෂ හා විශ්වකෝෂ මගින් දක්වන ලද සියලු නිර්වචන අනාථ වීම හෝ විසංයෝජනය වීම වැලකිය නොහැකි ය.

## විසංයෝජනයේ උපත

විසංයෝජන සංකල්පය හා අදාළ වචනය තමා වෙත පැමිණි ආකාරය ඩෙරීඩා විසින් පැහැදිලි කරනු ලබයි. "අනෙකුත් දේ අතර මට අවශ්‍ය වූයේ හයිඩගෙරියානු වචනයක් වූ Destruktion fyda abbau නැමැති වචන පරිවර්තනය කිරීම හෝ මගේ කාර්ය සඳහා යොදා ගැනීම ය". (ඩෙරීඩා එම) ඩෙරීඩාට පැහැදිලි ව ම අවශ්‍ය වූයේ මාර්ටින් හයිඩෙගර් (1889-1987) ගේ Destruktion නැමැති ජර්මන් වචනයට ප්‍රංශ භාෂාවෙහි එන වඩාත් ප්‍රමාණවත් පදයක් සොයා ගැනීම ය. මන්ද ඩෙරීඩාට අනුව ඉහත Destruktion යන පදය ප්‍රංශ භාෂාවෙහි නිෂේධනාත්මක අර්ථයක් ගැබ්කර ගත්තේ ය. ඒ අනුව 'තමා යෝජනා කළ කියවීම් රටාවට හෝ හයිඩගේරියානු අර්ථකථනයට' ගැලපෙන පදයක් සෙවීම අවශ්‍ය වේ (Derrida, J: 1883: 1) මෙහි දී 'හයිඩගේරියානු අර්ථකථනය' හා ඩෙරීඩාගේ 'කියවීම්. රටාව' යනුවෙන් අදහස් කිරීම මගින් ඒ දෙක ම සමානය යන්න අදහසක් ද මතුවීම වැලකිය නොහැකි ය. මේ අතර එක් වර ම Deconstruction යන පදය ඩෙරීඩාට සිහිපත් වේ. එසේ පැමිණි පදය Litter ලෙස පොදුවේ හැඳින්වන Emile Maximilien Poul Litter (1801-1881) නම් නිරුක්ති විද්‍යාඥයාගේ ප්‍රංශ ශබ්දකෝෂයෙහි විමසා බලන විට Deconstruction වෙනුවට ප්‍රමාණවත් බව ඩෙරීඩාරි කල්පනා වුනි.

## Destruktion සිට Deconstruction දක්වා

ඩෙරීඩාට ම අනුව විසංයෝජනය පිළිබඳ සංකල්පය සපයා ගනුයේ ජර්මන් ජාතික මාර්ටින් හයිඩෙගර්ගෙනි. මාර්ටින් හයිඩෙගර් Destruktion යන්න යොදා ගන්නේ බටහිර

ශිෂ්ටාචාරගත න්‍යාය හා සිද්ධාන්ත කැණීම් කිරීම සඳහා ය. ඔහුගේ Die Sein und Zeit නම් කෘතියට අනුව අදාළ සංකල්පයේ අරමුණ වූයේ මෙකී න්‍යාය හා සිධාන්ත ජනිත වීමට බලපෑ මුල් ම අත්දැකීම හෝ අනුභූතිය සොයා ගැනීම ය. හයිඩෙගර් කල්පනා කළේ අදාළ සිද්ධාන්ත විනාශ කිරීම (Destruktion) හරහා එහා කෙළවරෙහි පවතින මුල් ම අනුභූතිය සොයා ගත හැකි බව ය. සම්ප්‍රදාය ස්වාමිත්වයට පත්වන විට සිදුවන්නේ එමගින් විකාශය කරන දෙයට කිට්ටුවීමට ඇති ඉඩ ඇහිරීම යි. අසන්න වශයෙන් හෝ බොහෝ විට සැගවුණු ස්වභාවයක් ගනී. පරම්පරාවෙන් පැමිණි දෙය සම්ප්‍රදාය විසින් ගෙන එය ප්‍රත්‍යක්ෂය සේ යළි අප වෙත බාර දෙයි. සම්ප්‍රදාය විසින් එකී සංකල්පයන් හා ප්‍රවර්ග උපත ලද ප්‍රාථමික මූලාශ්‍රය වෙත යාමට අපට තිබෙන ඉඩ අසුරාලනු ලබයි. එපමණක් නොව මෙම සංකල්පයන්ට මෙවැනි උපතක් තිබෙන බව ද අපට අමතක කරවයි. සත්වයා පිළිබඳ ප්‍රශ්නය විනිවිද දැකීමට නම් මිදී ඇති සම්ප්‍රදාය ලිහිල් කළ යුතු ය. එහි රහස් දියකළ යුතු ය. අප මේ කාර්ය තේරුම් ගන්නේ සත්ත්වයා පිළිබඳ ගැටළුව ඉඟිය ලෙස ගෙන අදළ ප්‍රාථමික අනුභූතියට අප පැමිනෙන තුරු සත්තාවේ සාම්ප්‍රදායික අඩුම කුඩුම විනාශ කිරීම **(destruktion)** ලෙස ය (Heidegger, M, 1962: 42). කෙසේ වෙතත් එම කෘතියේ ම අන් තැනක එන පරිදි destruktion යන්න හයිඩෙගර් විසින් ම සංශෝධනය කරනු පෙනේ. destruktion යනු විනාශ කිරීම නොවේ. එහෙත් වියෝජනය කිරීම ය. වියෝජනය කොට පැත්තකින් තැබීම ය- විශේෂයෙන් ම දර්ශන ඉතිහාසය පිළිබඳ ප්‍රකාශ පමණක් එසේ කිරීම ය (Heidegger, M, 1962: 6). මේ අනුව **destruktion** යන්න විනාශ කිරීම ම නොව ඊට වඩා සුභවාදී යැයි හයිඩෙගර් විසින් ම කියනු ලබන වියෝජනය ලෙස දැක්විය හැකි ය.

මේ අනුව විසංයෝජනය පිළිබඳ අදහස මෙන් ම එහි භාෂාත්මක යෝජනය ද ඩෙරීඩා විසින් ලබා ගනුයේ හයිඩෙගර්ගේ කෘතිය ආශ්‍රයෙනි.

කෙසේ වෙතත් හබමාස් සඳහන් කරන ආකාරයට පශ්චාත් නූතනවාදය සංවර්ධනය කිරීමෙහිලා හයිඩෙගර් කෙරෙන් ලැබුණු සහය අතිවිශාල ය. ඒ අනුව ජර්මනියෙන් ප්‍රංශයට ගොස් පශ්චාත් නූතනවාදය ලෙස උපත ලබන දර්ශනය (?) එක් ප්‍රවණතාවක් නීට්ෂේගෙන් බටාලි හරහා ෆුකෝට ද අනෙක නීට්ෂේගෙන් හයිඩෙගර් හරහා ඩෙරිඩාට ද ගමන් කළ බව හබමාස් සඳහන් කරයි. (Cited In :Best & Kellner 1991: 28)

මේ අතර හයිඩෙගර් Destruktion නමැති සංකල්පය සපයා ගනුයේ කුමන මූලාශ්‍රයකින් ද යන්න සොයා ගැනීම මෙම සංදර්භය තුල වැදගත් වන්නේ ය. එය ඔහුගේ ම තර්කයට අනුව කිසියම් සංකල්පයක ප්‍රාථමික මූලාශ්‍රය සොයා ගැනීම මගින් අදාළ සංකල්පය විනිවිදිය හැකිය යන යෝජනාවට සපුරා ම එකඟ ය.

## හයිඩෙගර්ගේ *Destruktion* සංකල්පයේ ආරම්භය

19 වෙනි සියවසෙහි ජර්මනියේ පහළ වන ප්‍රිඩ්රිෂ් නීට්ෂේ (Friedrich Niestszche 1844-1900) නම් චින්තකයා නූතන බටහිර දර්ශනය පූර්ණ වෙනසකට ලක්කරන්නේ ය. නීට්ෂේගේ ප්‍රමුඛතම යෝජනාව වනුයේ ලෝකයේ සකලවිධ වටිනාකම් කනපිට පෙරළිය යුතු බව යි. (Umwertung aller Werte) තවදුරටත් ඔහු පවසන්නේ නිර්මාපකයකු විය යුතු අයෙකු පළමුවෙන් ම විනාශකයෙකු විය යුත්තේ ය. වටිනාකම් විනාශ කළ යුත්තේ ය යනුවෙන්ය. (ASZ: 216) මේ අතර නීට්ෂේගේ ඉහත සංකල්පය වටිනාකම් කනපිට පෙරළීම ලෙස අප විසින් මෙහි දී තැබුව ද අන් තැනක එය විනාශ කිරීම ලෙස ද දක්වා තිබේ. විශේෂයෙන් ම ඩෙරීඩා විසින් එය හඳුන්වා තිබෙන්නේ නීට්ෂියානු විනාශ කිරීම (Nietszchean Demolision) ලෙස ය (Derrida, J 1883: 1).

නීට්ෂේගේ වටිනාකම් කනපිට පෙරළීම හෝ ඩෙරිඩාට අනුව 'වටිනාකම් විනාශ කිරීම' පිළිබඳ සංකල්පය ඔහුගේ ලෝකයේ අනිවාර්ය අංගයක් ලෙස දැක්විය හැකි ය. ඊට හේතුව නීට්ෂේ සකලවිධ විශ්වය පිළිබඳ ව ම අනිත්‍යතා ව පිළිගැනීම යි. හෙතෙම Also sprach Zarathustra (Thus Spake Zarathustra) කෘතියේ දී පහත එන පරිදි ලියා තබන්නේ එනිසා ය. සියල්ල යයි. සියල්ල එයි. සංසාර චක්‍රය සදාකාලික ව පෙරළේ. සියල්ල මියැදෙයි. සියල්ල යළි ඉපදෙයි. එකම සංසාර මන්දිරය සදාකාලික ව ගොඩ නැගේ. සංසාර චක්‍රය සදා කල් එකසේ පවතී. (ASZ: 252)

බටහිර අභිධර්මයන් විනාශ කිරීමේ ව්‍යාපෘතියේ දී නීට්ෂේ නැගී සිටින වේදිකාව ඉහත කී අනිත්‍ය සංකල්පය යි. සියල්ල අනිත්‍ය වන අතර ආත්මය, කර්තෘ, දෙවියන් වහන්සේ ආදී සියල්ල හුදු භාෂා ප්‍රලාප ය. ලෝකය ම එකම සන්තතියක හෝ ප්‍රවාහයක (Continuum) පවත්නේ නම් (FW: 44) කිසිදු තිර ආත්මයක් දෙවියෙකු හෝ කර්තෘ කෙනෙකු ඊට හසු නොවී පැවතිය හැකි ද යන්නේ නීට්ෂේගේ මූලික ම ප්‍රශ්නය යි. බටහිර ශිෂ්ටාචාරයේ දෙදරුම් කෑවූ ඉහත ප්‍රශ්නය පසුකාලීන ව එකී ශිෂ්ටාචාරය දෙස නව මානයන්ගෙන් බලත හැකි නව ඥාන ප්‍රවණතා විශාල ප්‍රමාණයක් ඇති වීමට තුඩු දුන්නේ ය.

## බුදුදහම කුලුගෙඩියක් ලෙස උපයෝගීකොට ගැනීම

අනිත්‍ය සංකල්පය පදනම් කරගෙන නිපත් නීට්ෂේගේ වටිනාකම් විනාශ කිරීම ප්‍රධාන වශයෙන් ම පෝෂණය වන්නේ බුදුදහම හරහා ය. Will to Power කෘතියේ එන පාඨයකින් නීට්ෂේ විසින් තම ව්‍යාපෘතියේ දී ඒ සඳහා බුදු දහම යොදා ගත් බව තහවුරු වේ. 1885 දි කරන එම ප්‍රකාශය පහත එන පරිදි ය. කුලු ගෙඩියක් ලෙස යොදාගනු වස් යුරෝපියානු බුදුදහමක්

අනිවාර්යෙන් ම උවමනා වනු ඇත. (WP: 132) කුලු ඉෙඩියක් යොදා ගන්නේ බිඳහෙළීම හෝ විනාශ කිරීම සඳහා ය. ඒ අනුව ඔහු බුදුදහම හරහා එම කාර්ය කළ හැකි බව සිතුවේ ය. මේ අතර නීට්ෂේ හෙරක්ලීටස්ගේ විශ්වීය ගලායාම (universal flux) නැමැති ඉගැන්වීමෙන් ද විශාල බලපෑමක් ලද බව නිසැක ය. කෙසේ වෙතත් බුදුන් හා හෙරක්ලීටස් අතරින් නීට්ෂේ වඩාත් ම කැමති වන්නේ බුදුන්ට ය. බුදුන් වහන්සේ ලෝක දූකට එරෙහි ව යන "ගැඹුරු වෛද්‍යවරයෙකියි" (EH: 14) (Tiefe Physilog Buddha) පවසන නීට්ෂේ ඉතිහාසය තුළ හමුවන එකම සුභවාදී හා යථාර්ථවාදී ධර්මය බුදුදහම බව පෙන්වා දෙයි. (AC: 20) නීට්ෂේ වරක් ප්‍රකාශ කළේ තමන් යුරෝපයේ බුදුන් බව ය. (Mistry, F:1981: 2) ඔහුගේ will to power කෘතියට අනුව නීට්ෂේට අවශ්‍ය වූයේ "යුරෝපීය බුදුදහමක්" හඳුන්වා දීමට ය. (WP: 5)

නීට්ෂේගේ දර්ශනය අළලා කෘති දහයකටත් වඩා රචනා කරන හයිඩෙගර් නීට්ෂේගේ ප්‍රධාන දාර්ශනික කාරණා 5 ක් ගෙනහැර දක්වන්නේ ය. ඒවා නම් වටිනාකම් කනපිට පෙරළීම (හෝ විනාශ කිරීම) උත්තරමනුස්ස, ශූන්‍යතාව, බලාපේක්ෂාව, පුනරුප්පත්තිය යි. : Pearson, K.A, ed 1991: 283) පෙර සාකච්ඡා කළ පරිදි හයිඩෙගර්ගේ Die Sein und Zeit නම් කෘතියට අනුව Destruktion නම් සංකල්පයේ අරමුණ වූයේ න්‍යාය හා සිධාන්ත ජනිත වීමට බලපෑ මුල් ම අත්දැකීම හෝ අනුභූතිය සොයා ගැනීම යි. එසේ මුල් සොයා යාමේ ක්‍රමවේදය හයිඩෙගර්ට හමු වන්නේ නීට්ෂේ ඇසුරේ බව ප්‍රථමයෙන් සඳහන් කළ යුතු ය. නීට්ෂේගේ On Geneology of Moral කෘතිය ද එවන් ප්‍රයත්නයකි. එහි නම ම ඊට සාක්ෂි දරනු ඇත. Geneology යනු වංශාවලිය (Malalasekara Dictionary p : 569) යන අරුත් දෙන පදයකි. ආචාර ධාර්මීය අගතීන්හි සම්භවය පිළිබඳ මගේ සිතුවිලි පළමුවෙන් ම මවිසින් කෙටි හා තාවකාලික ප්‍රකාශන ලෙස ලීවේ *Human, All-too Human* නම් කෘතියේ ය. ඒ සංචාරකයෙකුට ගිමන් හරින්නට අවස්ථාව ලද විට ඔහු තමා මෙතැනට පැමිණි පුළුල් මෙන් ම භයානක භූමිය දෙස අවලෝකනය කරන්නා සේ ය. (OGM : 1) මෙසේ කිරීමේ අරමුණ ද නීට්ෂේ

පැහැදිලි කරයි. මිනිස්සු මෙම වටිනාකම් පහළ වූ ප්‍රත්‍යක්ෂ වූ කිසිදු විවාදයකින් තොර වූ ඒවා සේ ගනිති. (OGM :2) න්‍යාය හා සිද්ධාන්ත විනාශ කොට ඒවාහි ප්‍රාථමික අනුභූතිය සෙවීමේ අරමුණ නීට්ෂේගේ සේ ම හයිඩෙගර්ගේ ද සමාන ය. හයිඩෙගර් පවසන්නේ පරම්පරාවෙන් පැමිණි දෙය සම්ප්‍රදාය විසින් ගෙන එය ප්‍රත්‍යක්ෂය සේ යළි අප වෙත බාර දෙන බව ය. (:Heidegger, M, 1962: 42) තවදුරටත් කල්පිතයන් ගැන කතා කරන නීට්ෂේ මෙම ප්‍රබන්ධයන් දැන් එහි කල්පිත උපතට එරෙහි ව නොයන තරමට ම ඇබ්බැහියක් වී ඇත්තේ ය යනුවෙන් සඳහන් කරයි. (WP: 268) පැහැදිලි ව ම නීට්ෂේගේ මෙම පාඨය සිතෙහි තබාගෙන හයිඩෙගර් Die Sein und Zeit හි ලීවේ එපමණක් නොව මෙම සංකල්පයන්ට මෙවන් උපතක් තිබෙන බව ද අපට අමතක කරවයි යනුවෙනි Heidegger, M, 1962: 42)

කරුණු මෙසේ හෙයින් හයිඩෙගර්ගේ **destruktion** යන්න පැහැදිලි ව ම අදාළ ක්‍රමවේදය අතින් පමණක් නොව යොදාගත් වචනවලින් ද නීට්ෂියානු බව පැහැදිලි ය.

## බුදු දහමේ අනිත්‍යය යනු කුමක් ද?

"බ්‍රාහ්මණය, එය සියල්ල තමා වෙතට කැටිකොට ගෙන දෙගොඩතලා වේගයෙන් ගලා බස්නා ශිඛර ගංගාවක් වැනි ය. එය නවත්තා මොහොතක් ක්ෂණයකින් හෝ තත්පරයක් නැත්තේ ය. නොනැවතී ම ගලා යේ (Rahula:1978: 25)" උප්පාද ඨිති භංග වශයෙන් අන්තැනෙක ලෝකය විග්‍රහ කළ ද එහි එන ඨිති වශයෙන් වූ අවස්ථාවක් පරමාර්ථය වශයෙන් දක්නට නැත. මන්ද අනවතරයෙන් ගලා යන දෙයක නැවැත්මක් නොමැති නිසා ය. එහෙත් බෝමැඩ අසල දී පහළ වූ ලෞකිකාතික්‍රාන්ත ප්‍රඥාව ගැබ්කර දක්වීමට තරම් පෘථග්ජන භාෂා සංකේත ප්‍රමාණවත් නොවන නිසා ම එසේ ඨිති අවස්ථාවක් හඳුන්වා නොදී සිටිය නොහැකි වූවේ ය. සත් සතිය පුරා ම විටෙක බුදුන් වහන්සේ කල්පනා කළේ මෙකී ගැටළුව ය. ලෝකය පිළිබඳ අනිත්‍යතාව අන්තැනක විස්තර කරන කල්හී උන් වහන්සේ රට්ඨපාලයන්ට

පවසන්නේ ලෝකය එකම සන්තතියක (Flux) පවත්නා බව ය. (Rahula: 1978: 26) කරුණු එසේ හෙයින් අනිත්‍ය යනු විශ්වය තුළ පවත්නා අසංඛත නිර්වාණය හැර සියලු ම සංස්කාරයන්ගේ නිරන්තර වෙනස් වීම ය.

## විසංයෝජනයේ යථා ස්වරූපය

විසංයෝජනය නොවනුයේ කුමක් දැයි ඩෙරිඩා විසින් විග්‍රහ කළ ද බෞද්ධ අනිත්‍යතාව ද හිතෙහි තබාගෙන විසංයෝජනය යනු කුමක් දැයි ඩෙරීඩාගේ ම වචනවලින් හඳුනා ගැනීම දැන් කළ යුත්තේ ය. ඩෙරීඩාට අනුව විසංයෝජනය සිද්ධ වන්නේ ය. (Deconstruction takes place) එය සවිඥනිකත්වය හෝ කිසියම් කර්තෘවරයෙකුගේ සංවිධානය පතා නොසිටින 'සිද්ධවීමකි' (Derrida, J 1883: 4) ඩෙරිඩාට අනුව 'යමක් ලෝකයේ සිද්ධ වන්නේ ද එය විසංයෝජනය වන්නේ ය. මෙහි විශේෂය වන්නේ එය කිසිවෙකුගේ හෝ කිසිඳු බලවේගයක මැදිහත්වීමකින් තොර ව සිදුවිම ය. එම සිදුවීම සංවිධානය කරන හෝ හසුරුවන හෝ මෙහෙයවන කෙනෙකු නැත. මන්ද කෙනෙකු එසේ කරනවා නම් ඔහු ද විසංයෝජනයට ලක්වන බැවිනි. ඩෙරිඩා විසින් විසංයෝජනය විශ්ලේෂණ මෙවලමක් හෝ ක්‍රමවේදයක් ලෙස හෝ කිසිදු විධික්‍රමයක් ලෙස භාවිත කිරීමට එරෙහි වන්නේ මෙකී පදනම මත සිට ය. ඩෙරිඩාට අනුව විසංයෝජකයින් (Deconstructionist - Oxford English Dictionary: ed, James, A.H et el 1989: 346 ) හෝ විසංයෝජනවාද (Deconstructionism- Oxford English Dictionary: ed, James, A.H et el 1989: 346 ) පැවතීම කිසිසේත් ම නොවිය හැකි ය. කොටින් ම කෙනෙකුට යමක් (කෘතියක්) විසංයෝජනය කළ නොහැකි ය.

තවදුරටත් ඩෙරීඩා පවසන්නේ 'විසංයෝජනය යමක් තිබේන තැනක සිද්ධ වන්නේ නම් එය සෑම තැනක ම සිද්ධ වන්නේ ය' යනුවෙනි. එය 'වර්තමාන පොත්ගුලු අර්ථයෙන් අර්ථයට හෝ කෘතියට පමණක් සීමා වූවක් නොවේ'. යම් තැනක යමක් තිබේ ද ඒ හැම විසංයෝජනයට ලක් වන්නේ ය (Derrida, J: 1883: 4) එසේ නම් විසංයෝජනය කෙරෙන් ගැලවෙන හෝ බේරී යන කිසිවකු මෙම විශ්වය තුළ දක්නට නොමැත. විසංයෝජනය

නිර්වචනය කිරීමේ දී ඩෙරිඩාට බලපෑ එක ම දුෂ්කරතාව වූයේ ද මෙම කාරණය යි. එනම් විසංයෝජනය නිර්වචනය කිරීම සඳහා යොදා ගන්නා භාෂා මෙවලම් එනම් විශේෂණ සංකල්ප සංකේත යන සියල්ල ද කොටින් ම භාෂාව ද විසංයෝජනයට ලක් වේ.

Construction යනු ගොඩනැගීම හෝ ස්ථාපනය කිරීම ලෙස ගත හොත් Deconstruction යනු ගොඩනැගීම හෝ ගොඩනැගූ දෙය යළි බිඳ හෙළීම ය. ඉහත දක් වූ වචනය ම ස්ථාපනය කිරීම ලෙස ගත හොත් Deconstruction යනු එකී ස්ථාපනය විස්ථාපනය කිරීම ය. ඉහත අර්ථ දෙකෙහි ම අවසන් ඵලය වන්නේ ගොඩනැගීමක් බිඳහෙළීම ය. මේ අර්ථයෙන් ගතහොත් ඩෙරිඩාට හයිඩෙගර්ගේ Destruktion හෝ නීට්ෂේගේ Demolition යන පදවල ද තමාට අවශ්‍ය වූ අරුත් ගැබ් ව ඇති බව පෙනී යා යුතු ය. මන්ද Destruktion හෝ Demolition යන නාම පදවල සිංහල අර්ථය "විනාශවීම" ලෙස හෝ බිඳහෙළීම හෝ බිඳහෙළීයාම හෝ වියෝජනය ලෙස ද ගත හැකි නිසා ය. එකී අර්ථ අතුරින් එකක හෝ මෙහෙයුමක් මගින් අදාළ 'විනාශවීම' සිදුවෙතැයි ප්‍රකාශ නොවන හෙයිනි. කෙසේ වෙතත් ඩෙරිඩාට අනුව හයිඩෙගර්ගේ Destruktion ප්‍රංශ භාෂාවෙහි නිෂේධනාත්මක අරුත් ගෙන තිබේ. (Derrida, J, 1883: 1) මේ අතර සියලු සංස්කාරයෝ අනිත්‍යයැයි බුදුන් වහන්සේ වදාළ ප්‍රකාශය තුළ ගැබ්වන සෙසු අරුත් නම් වෙනස්වීම ප්‍රවාහය ගලායාම යනාදිය වන්නේ ය. භාෂාත්මක ව ඉහත කී වචන අතරින් ඕනෑ ම වචනයක පෘථග්ජනාර්ථයෙන් බුදුන් වහන්සේගේ 'අනිත්‍ය' සංකල්පය තුළින් හඳුනාගන්නා අර්ථයන් සපිරී තිබේ. එහෙත් පුහුදුන් අරුතින් අප විශේෂයෙන් ම සඳහන් කළේ අනිත්‍ය සංකල්පය තුළ අපගේ ගොරෝසු මනසට හසු නොවන කොටසක් ද ඇති බව හැඟවීමට ය. එනම් ප්‍රවාහයක් මගින් එක් කුඩා ම කුඩා අංශුවක් ගෙන බැලුව ද සමස්ත ප්‍රවාහය ම එහිදු පවතින කාරණය හා ප්‍රවාහයක් හෝ වෙනස්වීමක් එක් තැනකින් තවත් තැනකට ප්‍රවාහය වන්නේ නම් හෝ එක් තැනකින් තවත් තැනකට වෙනස් වන්නේ නම් එසේ වෙනස් වන තැන එනම් වෙනස්වීම පටන්ගන්නා වූ ස්ථානයේ වෙනස්වීමක් ඇති ද හෝ නැති ද යන්න ය. නමුත් එය අපගේ රළු බුද්ධියට හසු නොවන බව පෙනේ. හේතුඵලවාදය විස්තර කරන නීට්ෂේ ද බුදුදහම මගින් අදාළ හසුනොවීමට හේතුව

ලෙස ඉදිරිපත් කරන ඉන්ද්‍රියානුසාරී බුද්ධිය පිළිගන්නා බව පෙනේ ( Karunarathne, 1982: 34). බොහෝ එලයන් හටගන්නා ශීඝ්‍රතාව ම අප මුලාවට පත් කරන්නේ ය. එය අපට ක්ෂණයකි. එහෙත් මේ ක්ෂණය තුළ අප ඇසට නොපෙනෙන අනන්ත ක්‍රියාවලියක් සිදුවේ (FW: 44). මෙම "වර්තමානය" අවබෝධකර ගැනීමේ දුෂ්කරතාව දුටු ඩෙරීඩා එය Differance යනුවෙන් හැඳින්වූවේ ය. එනම් differance යනු නිරන්තර වෙනස්වන ලෝකයක නොවෙනස් කිසිවක් නොමැති හෙයින් 'වර්තමානය' සිතා ගැනීමට නොහැකි ලෙස අප වෙතින් ගිලිහී යාම යි. එය සිතීමට නතුකරගන්නා වාරයක් වාරයක් පාසා අපගේ සිතුවිල්ල ද ඉදිරියට.යේ. එය 'ප්‍රමාද' වේ. මේ අනුව විසංයෝජනය කතාකළ ඩෙරීඩාට Differance ගැන කතා නොකර සිටිය නොහැකි විය.

විසංයෝජනය හා අනිත්‍ය සංසන්දනාත්මක ව සලකා බලන විට අදාළ සංකල්ප හෝ සිදුවීම් දෙක මනා ව ඒවාහි සමානාසමතා සහිත ව විමර්ශනය කළ හැක. විසංයෝජනය යන්න මුළු විශ්වයට ම එකසේ බලපාන තත්වයක් වන බව ඩෙරීඩාගේ විසංයෝජනය යමක් තිබෙන සෑම තැනක ම සිද්ධ වන්නේ ය යනුවෙන් කළ ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ ය. සබ්බේ සංඛාරා අනිච්චා යනුවෙන් බුදුන් වහන්සේ කරන ප්‍රකාශයට එකඟව අනිත්‍යයතාව ද මුලු විශ්වයට ම එනම් (ඩෙරීඩාගේ වචනවලින්) යමක් තිබෙන සෑම තැනක ම සිද්ධ වන්නේ ය. විසංයෝජනය සේ ම අනිත්‍ය ද සකලවිධ ගොඩනැගීම් විනාශවන බව ද වෙනස්වන බව ද තිරනොවන බව ද පැහැදිලි කරයි. අනිත්‍ය කිසිවෙකුගේ මෙහෙයවීමකින් තොර ය. ඩෙරීඩාට අනුව විසංයෝජනය ද එසේ ම ය. අදාළ තත්වයන් දෙක තුළ ම ඊට නතු නොවී ඉන් පරිබාහිර ව සිට අදාළ ක්‍රියාව සිදුකරන බලවේගයක් හෝ පුද්ගලයකු නැත. අනිත්‍ය සේම විසංයෝජනය තුළ නැවැත්මක් නැත. එය අනවතරයෙන් ·සිද්ධ වන්නේ ය. බුදුන් වහන්සේට අනුව ක්ෂණභංගුර වන්නේ ය.

## නිගමනය

මේ අනුව අදාළ සංකල්පය හෝ තත්වයන් දෙක ම පරීක්ෂා කර බලන විට ඒවා එකිනෙකින් වෙනස්වන මූලික වෙනස්කම් කිසිවක්

හඳුනාගත නොහැක. ඊට එක් හේතුවක් ලෙස අප දකින්නේ ඩෙරීඩා විසින් හයිඩෙගර් වෙතින් Destruktion හරහා Deconstruction තනා ගැනීම ය. එහෙත් එය එසේ කීම ප්‍රමාණවත් නැත. මන්ද ඩෙරීඩා හයිඩෙගර්ට තිබූ සම්බන්ධය ඍජු ව ම නීට්ෂේට ද තිබුණේ ය. ඩෙරීඩාගේ *Spurs*: Nietzsche's Styles (1979) නම් කෘතිය ඊට සාක්ෂි සපයයි. ඔහුගේ එම පාඨයට අනුව Deconstruction සංකල්පයේ පුරෝගාමියා නීට්ෂේ ය. (Derrida: 1979, 23) කරුණු මෙසේ හෙයින් ඩෙරීඩා විසින් හයිඩෙගර් වෙතින් ලබාගනුයේ අනිත්‍ය සංකල්පය ම ය. එසේ ලබා ගත් පසු ඩෙරීඩා විසින් අදාළ සංකල්පය තමාට අවශ්‍ය පරිදි හැඩ ගසා ගන්නා ලදී. එහි දී ඔහුට ඍජු ව ම නීට්ෂේ කියවීමෙන් අදාළ සංකල්පය තවදුරටත් පෝෂණය කරගැනීමේ අවස්ථාව ලැබුණේ ය. ඒ අනුව එම සංකල්පය හයිඩෙගර්ගේ සීමා සහිත Destruktion වෙතින් එපිට ගොස් ඩෙරීඩා හරහා නියම අනිත්‍ය සංකල්පයේ රුවගුණ වැහෙන්නට වුණි. තම "නව" සංකල්පයේ කාර්යසාධනය මගින් ඩෙරීඩා කොතරම් උද්දාමයට පත්වූයේ ද කිවහොත් ඔහු විසින් එය තම මූලික කාර්ය වූ කෘති විචාරයට පමණක් සීමා නොකොට යමක් තිබෙන ඕනෑ ම තැනකට අදාළ බව ප්‍රකාශ කරන ලදී. විටෙක ඩෙරීඩා විසින් සංකල්පය නොව සංකල්පය විසින් ඩෙරීඩා ව එම තත්වයට ගෙනවිත් තිබුණි. ඒ අනුව ඩෙරීඩා බෞද්ධ අනිත්‍ය ධර්මයේ ගොදුරක් බවට පත්වන්නේ ඔහුගේ ම අනුදැනුමකින් ද තොරව ය.

## Abreviations

Friedrich Nietszche

| | |
|---|---|
| ASZ | Also sprach Zarathustra |
| AC | Antichrist |
| FW | Froehnliche Wissenschaftt |
| WP | Will to Power |
| OGM | On the Geneology of Mora |

# References

## Original Texts

Derrida, J (1985) Letter to a Japanese. *Derrida and Differance*, ed. Wood & Bernasconi, Warwick: Parousia Press. p. 1-5

Friedrich Nietzsche, *Also sprach Zarathustra*, (ASZ) (1974) Wolfgang Deniger,(ed) Consortium AG, Zuerich.

Friedrich Nietzsch, *Antichrist*, (AC) (1974) Wolfgang Deniger,(ed) Consortium AG, Zuerich.

Friedrich Nietzsch, *Froehnliche Wissenschaftt*,(FW) (1974) Wolfgang Deniger,(ed) Consortium AG, Zuerich

Friedrich Nietzsche, *Will to Power*, (WP)(1995) Trans, Walter Kaufman, Vintage, USA

Friedrich Nietzsche, On the Geneology of Moral (OGM) (1989), Trans. Walter Kaufmann. Vintage, USA

Heidegger, Martin *Being and Time*, (1962) trans. John Macquarrie and Edward Robinson: Harper & Row, New York

Derrida, Jacques, (1979) *Spurs: Nietzsche's Style* trans. Barbara Harlow (Chicago & London: University of Chicago Press, 1979).

## Dictionaries and Encyclopedias

Encyclopedia of Contemporary Literary Theory (1993), ed Irena, R, University of Toronto Press, Toronto.

A Dictionary of Literary Terms and Literary Theory, (1991) Ed, Preston, C, E third Ed: Blackwell, London

A Dictionary of Critical Theory, ed, Leonard Orr (1996): Blackwell, London

*The Internet Encyclopedia of Philosophy*, Renolds, Jack http://www.iep.utm.edu/, today's date)

Oxford English Dictionary (1989) Ed, James A.H. et el Oxford University Press, Oxford

Malalasekara Dictionary, 1995, ed Malalasekara, GP, Gunasena, Colombo

## Secondary Sources

Rahula, Walpola, (1978) *What the Buddha taught*, Gordan Fraser, London

Karunaratnna WS, (1982) *Baudha Darshanaya ha Charanaya*. Godage, Colombo

Best, S & Kellner, D (1991) *Postmodern Thoery*, Macmillan Press, London

Philipse, H, (1999) *Heidegger's Philosophy of Being*, Motilal Banarasdass, Delhi

Mistry, f, (1981) *Nietszche and Buddhism*, de Gruyter, New York